# ඔබට මේ ලක්ෂණ තිබේද?

| | | |
|---|---|---|
| ගැටිති සහ ඉදිමීම් | අසාමාන්‍ය ලේ ගැලීම් | පැහැදිලි කළ නොහැකි බර අඩුවීම් |
| දිගු කාලීනව පවතින වේදනාව | සති 2 කට වැඩි වැසිකිළි පුරුදුවල වෙනස්කම් | දිගට පවතින කැස්ස, හඬ බෙදීම සහ හුස්ම ගැනීමේ වෙනස්කම් |
| උපන් ලපයක වෙනස්කම් / සමේ ඇතිවන නව වෙනසක් | ඔබේ පියයුරු වල සීඝ්‍රම වෙනසක් | දිගු කාලීනව පවතින බඩ පිපීම |

ඉහත ලක්ෂණ එකක් හෝ ඔබට ඇත්නම්, පිළිකා කලින් හඳුනා ගැනීමේ මධ්‍යස්ථානයට පැමිණෙන්න

## අපගේ කණ්ඩායම

- වෛද්‍ය නිලධාරීන්
- දන්ත ශල්‍ය වෛද්‍යවරුන්
- මහජන සෞඛ්‍ය හෙද සොයුරිය
- හෙද නිලධාරීන්
- විකිරණවේද ශිල්පීන්
- වෛද්‍ය රසායනාගාර තාක්ෂණ ශිල්පී
- සෞඛ්‍ය සේවා සහායකවරුන්

(මැමෝග්‍රැෆි වාර්තා කිරීම විකිරණවේද විශේෂඥ වෛද්‍යවරයෙක් විසින් සිදු කරනු ලබයි.)

# පියයුරු පිළිකා

ලංකාවේත්, ලෝකයේත් බහුලතම පිළිකාවයි!

දිනකට නව රෝගීන් 15 ක්

සතියකට නව රෝගීන් 3 ක්

- පිරිමින්ගේ වැඩි මරණ අනුපාතයක් සහිත ආක්‍රමණශීලි පිළිකාවකි.
- මවකිරි දීමෙන් පිළිකා අවදානම අඩුවේ.

| අවදානම් සාධක | බැලිය යුතු රෝග ලක්ෂණ |
|---|---|
| වයස්ගත වීම | පියයුරු ප්‍රමාණයේ වෙනස්කම් |
| පියයුරු පිළිකා පිළිබඳ පවුල් ඉතිහාසය | සමේ රතු පැහැය |
| දුම්පානය සහ මත්පැන් | සම වල ගැසීම |
| ආර්තවහරණයෙන් පසු තරබාරුකම | පියයුරුවල හෝ කිහිල්ලේ යට ගැටිති |
| හෝර්මෝන ප්‍රතිස්ථාපන ප්‍රතිකාර | පියයුරු මත සුව නොවන තුවාල |
| | තන පුඩුව ගිලීම/ තන පුඩුවෙන් ලේ හෝ දියර ගැලීම |

- ඔබට ඉහත අවදානම් සාධක/ රෝග ලක්ෂණ ඇත්නම් ප්‍රමාදයකින් තොරව පිළිකා කලින් හඳුනා ගැනීමේ මධ්‍යස්ථානය වෙත පැමිණෙන්න.

## අප සපයන සේවාවන්

- ස්වයං පියයුරු පරීක්ෂාව පිළිබඳ අධ්‍යාපනය
- සායනික පියයුරු පරීක්ෂාවන්
- පියයුරු අල්ට්‍රා සවුන්ඩ් ස්කෑන් පරීක්ෂණ
- මැමෝග්‍රැෆි - සායනයේ වෛද්‍යවරයාගේ නිර්දේශය මත

# ගැබ්ගෙල පිළිකා

- ගර්භාෂයේ ගෙලෙහි ඇතිවන පිළිකාවකි.
- ගැබ්ගෙල පිළිකාවලින් 90% ක් මානව පැපිලෝමා වයිරසය (HPV) ආසාදනය වීම නිසා ඇතිවේ.




- ගැබ් ගෙල පිළිකා වැළැක්විය හැකි මෙන්ම, මුල් අවධියේදී හඳුනා ගතහොත් සුව කළ හැකි පිළිකාවකි.

HPV ආසාදනය හඳුනා ගැනීමට HPV-DNA පරීක්ෂණය සහ ගැබ්ගෙල පිළිකා හෝ පූර්ව පිළිකා තත්ත්වයන් හඳුනා ගැනීමට PAP පරීක්ෂණය මෙහිදී සිදු කෙරේ.